| |
|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| **දෙවන වාර පරීක්ෂණය - 2018** |

| | | |
|---|---|---|
| **සංගීතය** | **06 ශ්‍රේණිය** | **කාලය පැය. 02 යි** |

**නම: ..............................................................**

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) සීරුවෙන් සිටිමින් ගායනා කළ යුතු ගීතයකි,

    i. ළමා ගීතය    ii. පාසල් ගීතය    iii. කෙළි ගීතය.    iv.ස්වර ස්ථාපන ගීතය

2) උපන් දේශයට ප්‍රණාමය දැක්වීමට ගයනු ලබන්නේ,

    i. සරල ගීයයි    ii. ජාතික ගීයයි    iii. විජාතික ගීයයි    iv. ළමා ගීයයි

3) අපේ ජාතික ගීයේ හා ඉන්දියානු ජාතික ගීයේ එක් සමානකමකි,

    i. මාත්‍රා 3/3 බෙදී ඇත.    ii. මාත්‍රා අසමානව බෙදී ඇත.

    iii. මාත්‍රා 4/4 බෙදී ඇත.    iv. මාත්‍රා බෙදීමට නොහැක.

4) ජාතික ගීයේ ආරම්භක පද කොටස නිවැරදි ලෙස ප්‍රස්ථාර වී ඇත්තේ,

    i. / ශ්‍රී s ල / ං කා s / මා s තා / s s s /

    ii. / ශ්‍රී ල ං කා / s s මා s / තා s s s /

    iii. / ශ්‍රී s ල ං / කා s මා s /තා s s s / s s

    iv. / ශ්‍රී s ල ං / කා මා තා s /

5) ''සුවඳ පත්ම ඕළු ආදී'' නම් ගීතය අයත් නූර්තිය,

    i. දුටුගැමුණු    ii. වෙස්සන්තර    iii. විදුර    iv. පද්මාවතී

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(වයලීනය, බටනලාව, තබ්ලාව, ඉංග්‍රීසි මැන්ඩලීනය, සිතාරය)

6) සිරස් හා තිරස් යනුවෙන් දෙආකාරයකින් ඇත්තේ ............................................

7) එක් ස්වරයකට තත් දෙක බැගින් තත් 8 කින් යුත් සංගීත භාණ්ඩය. ........................................

8) නායකී තාර් ප්‍රධාන තත වන තත් 7 කින් යුත් සංගීත භාණ්ඩය .............................................

9) අවනද්ධ භාණ්ඩය වන්නේ, ..........................................

10) තත් 4 කින් සමන්විත Baw (බෝ) එකකින් වයන භාණ්ඩය .............................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

11) තබ්ලාව, බායාව සහ දහිනාව ලෙස කොටස් දෙකින් සමන්විත ය. ( )

12) ගිටාරය අළුවෙන් (Baw) වාදනය කරයි. ( )

13) /සසස/රිරිරි/ගගග/මමම මෙම ස්වර රටාව මාත්‍රා 3/3 බෙදී ඇත. ( )

14) ''ජන ගන මන අධි නායක'' යනුවෙන් ඇරඹෙන්නේ ඉන්දියානු ජාතික ගීතයයි. ( )

15) එකල නූර්ති ගීත රංගනයේ යෙදෙන නළු නිළියන් විසින්ම ගායනා කර ඇත. ( )

- **ප්‍රශ්න අංක 16 -20 දක්වා A හා B තීරුවල කොටස් නිවැරදිව යා කරන්න.**

| A | B |
|---|---|
| 16) වත ඒ පුන් සඳ මෙන් බබලාවි | එළුවන් කෑම හා බැඳේ. |
| 17) දොඩම් කපාලා ඇඹුල් තනාලා | නූර්ති ගීයකි. |
| 18) සාර සදිසි පෙති පේර | කළගෙඩි සෙල්ලම හා බැඳේ |
| 19) මේ වැල මොකදෝ දම්වැල | මේවර කෙළියේ ගීයකි |
| 20) අද වෙස්සන්තර රාජ පුතා | ඔළිඳ කෙළියේ ගීයකි |

## II කොටස

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවෙනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**

1)

i. කෙළි ගී කෙටියෙන් හඳුන්වන්න. (ල. 03)

ii. කෙළි ගී වර්ග 3ක් නම් කරන්න. (ල. 03)

iii. ඉන් එක් කෙළි ගී වර්ගයක කවියක් ලියන්න. (ල. 04)

2)

i. ජාතික ගීයේ නිර්මාතෘවරයා නම් කරන්න. (ල. 02)

ii. ''ඔබවේ අප විද්‍යා ඔබමය අප සත්‍යා'' යන ගී පාදයේ නාද මාලාවට සමානව ගැයෙන ගී පාදයක් ජාතික ගීය තුළින් සොයා දක්වන්න. (ල. 04)

iii. ජාතික ගීයේ මුල් කොටස ලියන්න. (ල. 04)

3)

i. නුර්ති ගී වලට කුමන සංගීතයේ ආභාෂය ලැබී ඇත්ද? (ල. 02)

ii. නූර්ති ගී සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ 3 ක් නම් කරන්න. (ල. 03)

iii. එක් නූර්ති ගීයක මුල් කොටස (ස්ථායි) සහ දෙවෙනි කොටසක් (අන්තරා) පදමාලාවක් ලෙස ක්‍රමවත්ව ලියන්න. (ල. 05)

4)

i. පහත ස්වර අභ්‍යාසයේ රටා දෙක හඳුනාගෙන අදාළ කොටස් සම්පූර්ණ කරන්න.

ස - රි ග / රි - ග ම / ග - ම ප / - - - -/
ප - ධ නි / - - - - / ස̇ - නි ධ / - - - - /
ධ - ප ම / - - - - / - - - - / - - - -/ (ල. 06)

ii. ස ස රි - / ග රි ස - / රි රි ග - / ම ග රි - /
ග ග ම - / - - - - / ම ම ප - / - - - - /
- - - - / නි ධ ප - / ධ ධ නි -/ - - - - / (ල. 04)